"කාර්යක්ෂමතාවයෙන් යුත් ඵලදායි පළාත් සභා රාජ්‍ය සේවයක්"

**ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**
ஊவா மாகாண சபை அரசாங்க சேவை ஆணைக்குழு
Uva Provincial Council Public Service Commission

අංක 14 4, පීලිපොතගම පාර,පිංරාව,බදුල්ල. இல 14 4,பீலிபொத்தகம வீதி,பிங்கராவ,பதுளை. No 14 4,Peelipothagama Road, Pinarawa,Badulla.

මගේ අංකය / எனது இல / My No. 3/3/1/136 (2)
ඔබේ අංකය / உமது இல / Your No. ..........
දිනය / திகதி / Date 2026.06. 01

ඌව පළාතේ ප්‍රධාන ලේකම්,
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්,
ඌව පළාත් සමූපකාර කොමිෂන් සභාවේ ලේකම්,
ඌව පළාත් සභාවේ සභා ලේකම්,
ඌව පළාත් සභාවේ සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානීන්,
වෛද්‍ය අධිකාරී, මූලික රෝහල - දියතලාව/මහියංගණය/වැලිමඩ,
නාගරික කොමසාරිස් - බදුල්ල/බණ්ඩාරවෙල,
නාගරික ලේකම්,හපුතලේ,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු,
සියලුම ප්‍රාදේශීය සභා ලේකම්වරු,

**ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ රියදුරු සේවයේ III ශ්‍රේණියට**
**සීමිත පදනම මත බඳවා ගැනීම - 2026**

උක්ත කරුණට අදාළව ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ රියදුරු සේවයේ III වන ශ්‍රේණියට අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. (එකී අභ්‍යන්තර නිවේදනය www.psc.up.gov.lk යන වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක.)

02. එකී නිවේදනය මඟින් කැඳවා ඇති මාර්ගගතව අයදුම් කිරීමේ අවසාන දිනය **2026.06.26** වන අතර, මේ සම්බන්ධයෙන් ඔබ ආයතනයේ /දෙපාර්තමේන්තුවේ/අමාත්‍යාංශයේ සේවය කරන PL 1 හා PL 2 වැටුප් බාණ්ඩවල සේවය කරන සේවකයන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත්, මේ සඳහා අයදුම්කිරීමට කැමති හා අයදුම්පත් කැඳවීමේ නිවේදනය ප්‍රකාරව සුදුසුකම් සපුරන අය වෙතොත් https://exams.psc.up.gov.lk/ වෙබ් සබැඳිය ඔස්සේ මාර්ගගත අයදුම් කිරීමේ ප්‍රවේශය වෙත පිවිස මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කර පද්ධතියට යොමු කළ පසු අයදුම්පතේ මුද්‍රිත පිටපත බාගත කර ගෙන අදාළ නිර්දේශ සහිතව 2025.07.03 වන දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබීමට සලස්වන ලෙසත් කාරුණිකව දන්වමි.

03. තවද, මෙම තනතුර සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන් ඌව පළාත් සභා රාජ්‍ය සේවය යටතේ පත්වීම් ලබා ඇති/ ඌව පළාත් සභා රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කර ඇති අය බවට හා මෙම තනතුර සඳහා අයදුම් කිරීමට සෑම අතින්ම සුදුසුකම් ලබා ඇති බවට අදාළ ආයතන ප්‍රධානීන්/දෙපාර්තමේන්තු ප්‍රධානීන් පෞද්ගලිකවම සහතික කර තිබිය යුතුය.

(එල්.ඒ.සෝමරත්න)
ලේකම්
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ගරු සභාපතිතුමා / கௌ.தவிசாளர் / Hon. Chairman } 055 - 2222150
ලේකම් / செயலாளர் / Secretary } 055 - 2223482
පොදු / பொது / General } 055 - 2222400
සහකාර ලේකම් / உதவி செயலாளர் / Asst.Secretary } 055 - 2225148, 055 - 2232857(Exam)
පරිපාලන නිලධාරී / நிர்வாக உத்தியோகத்தர் / Administrative Officer } 055 - 2222400
Fax - 055-2232858
Website - www.psc.up.gov.lk
E-mail - uppscb@gmail.com

# <u>ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ රියදුරු සේවයේ III ශ්‍රේණියට</u>
# <u>සීමිත පදනම මත බඳවා ගැනීම - 2026</u>

**01.** ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ රියදුරු සේවයේ III වන ශ්‍රේණියේ පුරප්පාඩුව පවතින රියදුරු තනතුරු 07 ක් බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් සහිත ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු සේවකයින්ගෙන් 2026.06.26 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**02. බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :-**

I. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යකින් යුක්ත විය යුතුය.
II. අයදුම්කරුගේ උස අවම වශයෙන් අඩි 5 ක් විය යුතුය.
III. දිවා කාලයේ සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද විධිමත් සහතිකයක් මගින් ඒ බව සනාථ කළ යුතුය.

❖ 2026.06.26 දිනට ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ රියදුරු සේවයේ III වන ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 30% ක ප්‍රමාණයක් මෙම සීමිත තරඟ විභාගයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

| අනු අංකය | තනතුර හා බඳවා ගන්නා ශ්‍රේණිය | අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද | බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය |
|---|---|---|---|
| 01 | ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ රියදුරු<br><br>III ශ්‍රේණිය<br><br>උපරිම වයස් සීමාව :- අවුරුදු හතලිස් පහ (45) ට නොවැඩි විය යුතුය | **අධ්‍යාපන සුදුසුකම්**<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම.<br><br>**වෘත්තීය සුදුසුකම්**<br><br>පෞද්ගලික / කුලී රථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.<br><br>(බඳවා ගන්නා දිනට වසර තුනක (03) ට පෙර අවම වශයෙන් සී සහ සී1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා සිටිය යුතුය.)<br>හා<br>මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය<br><br>**පළපුරුද්ද**<br><br>ඌව පළාත් සභාව යටතේ පවතින ආයතනයක ප්‍රාථමික ශිල්පිය නොවන (PL1) හෝ ප්‍රාථමික අර්ධ ශිල්පිය (PL 2) තනතුරක අවම වශයෙන් වසර පහ(05)කට නොඅඩු අඛණ්ඩ සක්‍රිය හා සතුටුදායක ස්ථිර සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා අදාළ තනතුරේ ස්ථිර කර තිබීම | **විෂය**<br><br>මාර්ග නීති පිළිබඳව දැනුම හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම<br><br>**කාලය -** පැය 02<br><br>(ලිඛිත පරීක්ෂණය සමත්වීම සඳහා අවම වශයෙන් 40% ලකුණු ලබා ගත යුතුය.) |

02 පිටුවට......

**03.** වැටුප් පරිමාණය :

ඌව පළාත් රාජ්‍ය සේවයේ රියදුරු සේවයේ – III ශ්‍රේණිය සඳහා, රා.ප.ච. 10/2025 හි PL 3 - 2025 අනුව, රු. 42,780 - 10 x 490 - 10 x 540 - 10 x 590 - 12 x 630 – 66,540/- ක වැටුප් පරිමාණය හිමි වේ. උක්ත චක්‍රලේඛයේ උපලේඛන III අනුව 2027.01.01 දින දක්වා වැටුප් ගෙවනු ලැබේ.

**04.** බඳවා ගැනීමේ ක්‍රමය :-

I. ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් පළ කිරීම මගින් හෝ වෙබ් අඩවියේ පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් පරීක්ෂා කිරීමෙන් පසු සුදුසුකම් සහිත අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් සඳහා ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සමත් අයදුම්කරුවන් ලබා ගත් ලකුණු ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සමත්වී වෘත්තීය පරීක්ෂණය සමත් වූවන්ගේ ලකුණු එකතුවෙහි ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

වෘත්තීය පරීක්ෂණයේදී පහත සඳහන් නිර්ණායකයන් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| රිය පැදවීමේ නිපුණත්වය | 40 | 20 |
| මහා මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 | 20 |
| මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | 10 |

II. ලිඛිත පරීක්ෂණය සමත්වීම සඳහා අවම වශයෙන් 40%ක්ද, වෘත්තීය පරීක්ෂණය සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 40%ක්ද ලබා ගත යුතුය.

III. ලිඛිත හා වෘත්තීය පරීක්ෂණ ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලැබේ. ඒ අනුව තෝරා ගන්නා ලද පත්වීම් නාම ලේඛනය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පත්වීම් බලධාරියා වෙත ලබා දීමෙන් අනතුරුව පත්වීම් බලධාරියා විසින් පත්වීම් ලිපි ලබා දෙනු ලැබේ.

**05.** අයදුම්පත් ඉදිරිපත් කිරීම :-

මෙම විභාග සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයින්, https://exams.psc.up.gov.lk/ වෙබ් සබැඳිය ඔස්සේ මාර්ගගත අයදුම් කිරීමේ ප්‍රවේශය වෙත පිවිස **2026.06.26** දින හෝ ඊට පෙර විභාගය සඳහා මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කළ යුතු අතර, එම අයදුම්පත සම්පූර්ණ කර පද්ධතියට යොමු කළ (Submit) පසුව අයදුම්පතේ මෘදු පිටපත බාගත (මෙනුවෙහි Application වෙත පිවිසෙන්න) කර ගත යුතුය. බාගත කර ගන්නා ලද අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගෙන විභාගය සඳහා විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය ද නියමිත ස්ථානයේ අලවා, ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් **2026.07.03** දින හෝ ඊට පෙර "ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 14/4, පීලිපොතගම පාර, පිංඅරාව, බදුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ "ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ රියදුරු සේවයේ III ශ්‍රේණියට සීමිත පදනම මත බඳවා ගැනීම - 2026 " යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

03 පිටුවට......

**06**. එසේම, මාර්ගගත පද්ධතිය ඔස්සේ විධිමත්ව සම්පූර්ණ නොකරන ලද හා අසම්පූර්ණ තොරතුරු සහිත හෝ වැරදි තොරතුරු සහිත සියලු අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රයේ හා මුදල් ගෙවා ලබාගන්නා ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම අයදුම්කරුවන්ට ප්‍රයෝජනවත් වනු ඇත.

**සටහන - මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026.06.01 දින පෙ.ව 9.00 ට විවෘත වන අතර, 2026 06.26 වන දින ප.ව 11.59 ට අවසන් වේ.**

**07 අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීම :-**

අයදුම්පතෙහි ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන තම ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කරනු ලැබ තිබිය යුතුය.

**08. විභාග හා පරිපාලන වියදම් :-**

8.1 විභාග ගාස්තු හා පරිපාලන වියදම් රු.1250/- කි. මෙම මුදල ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20.03.02.13 ට බැර වන පරිදි ඌව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලද ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා එවිය යුතුය. ලදුපතේ මුල්පිටපත අයදුම්පත්‍රයට අමුණා එවීම අනිවාර්ය වන අතර, ඉදිරි ප්‍රයෝජනය සඳහා එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම වැදගත් වේ. ඌව පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබා ගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් හෝ මුද්දර හෝ භාරගනු නොලබන අතර, කුමන හේතුවක් නිසා හෝ මෙම විභාග හා පරිපාලන ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

8.2 බඳවා ගැනීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2026.06.26 දිනට මෙම නිවේදනයේ සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කර ඇති, පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි විධිමත් අයදුම්පත් සංඛ්‍යාවක් ඉදිරිපත් වී ඇත්නම් පමණක් එකී අයදුම්කරුවන් සහතික පත්‍ර පරීක්ෂා කිරීමකින් තොරව සීමිත තරඟ විභාගයට ඉදිරිපත් කරනු ලැබේ.

8.3. විභාගය පැවැත්වීමට අවම වශයෙන් දෙසතියකට පෙර ප්‍රවේශ පත්‍ර ඊමේල් (Email) මගින් එවනු ලබන අතර, විභාගය සඳහා අයදුම් කිරීමේ දී විද්‍යුත් තැපැල් ලිපිනය (Email Address) නිවැරදිව සඳහන් කළ යුතුය. විභාග දිනට සතියකට පෙර ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් ඒ පිළිබඳව ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අයදුම්පත්‍රයේ සහතික කළ ඡායා පිටපතක්, මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ පිටපතක් ද, ප්‍රවේශ පත්‍රය එවීම සඳහා වට්සැප් (WhatsApp) අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීමක් කළ යුතු වේ. මීට අමතරව https://exams.psc.up.gov.lk/admission/ සබැඳිය මගින් ද විභාග ප්‍රවේශ පත්‍රය බාගත කර ගැනීමට පහසුකම් සලසනු ඇත. ඒ අනුව වෙබ් අඩවියෙන් ප්‍රවේශ පත්‍රය භාගත කර ගෙන පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් අදාළ තීරුවෙහි සංශෝධනය විය යුතු ආකාරය නිවැරදිව සඳහන් කර අයදුම්කරුගේ අත්සන යෙදිය යුතු වේ. තරඟ විභාගය සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට වූ පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

8.4 නියමිත විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

04 පිටුවට......

8.5 විභාග දිනයේ දී අපේක්ෂකයාගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත, වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම ලියවිලි හැර වෙනත් කිසිදු ලියවිල්ලක් පිළිගනු නොලැබේ.

8.6 තරඟ විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පතක් නිකුත් කිරීම, අයදුම්කරු අදාළ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් එම අයදුම්කරු පත්වීම් ලබා දීම සඳහා නුසුදුස්සෙකු ලෙස සලකනු ලැබේ.

8.7 මෙම තරඟ විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අපේක්ෂකයෙකු මුළු විභාගය සඳහාම පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකිනි. අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු භාෂා මාධ්‍යය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

**09. සාවද්‍ය තොරතුරු සැපයීම :-**

මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුව ද අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ යම් තොරතුරක් සාවද්‍ය බව හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

මෙම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීම / නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාවෙන් කොටසක් සම්පූර්ණ කිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව හෝ මේ සම්බන්ධයෙන් වන කුමන හෝ කරුණක් පිළිබඳ අවසාන තීරණය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම / තීරණය කිරීම ඌව පළාත් ආණ්ඩුකාරවරයාගේ උපදෙස් මත ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සිදු කරනු ඇත.

**10.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**11.** තරඟ විභාගය බදුල්ල හා මොණරාගල නගරවලදී පැවැත්වීමට අපේක්ෂා කෙරේ. අයදුම්කරුවන් සංඛ්‍යාව අනුව විභාගය පැවැත්විය යුතු නගර පිළිබඳ ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරනු ඇත.

**12.** මේ පිළිබඳ වැඩි විස්තර කාර්යාල වේලාව තුළ ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දුරකථන අංක 0552222400, 0552231460 ඇමතීමෙන් ලබා ගත හැකිය.

(එල්.ඒ.සෝමරත්න)
ලේකම්
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2026.06.01 වන දින,
බදුල්ල
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.